Department of Education, Sabaragamuwa Province/ Weekly School Department of Education, Sabaragamuwa Province/ Weekly School


**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල**


ශ්‍රේණිය : 6 | විෂය : ගණිතය | සතිය : 23

**පාඩම :- සංඛ්‍යා වර්ග හා සංඛ්‍යා රටා (1 වන සතිය)**

**කාලච්ඡේද ගණන :- 10**

- පහත දැක්වෙන ගල් කැට ප්‍රමාණ දෙකේ ගොඩවල්වලට වෙන් කරන්න.





පෙළපොතේ 25, 26 පිටු හොඳින් අධ්‍යයනය කරන්න.


1 සිට 10 තෙක් එක් එක් සංඛ්‍යාව දැක්වීමට තිත් රටා අඳින්න. එම තිත් දෙකේ ගොඩවල්වලට වෙන් කරන්න. එම සංඛ්‍යා එක එකක් ඔත්තේ ද ඉරට්ටේ ද යන්න ලියන්න.


උදා:- සංඛ්‍යාව 7




- ඔබ සොයා ගත් ඔත්තේ සංඛ්‍යා ලියන්න.
- ඔබ සොයා ගත් ඉරට්ට සංඛ්‍යා ලියන්න.

"0" ඉරට්ට ද ඔත්තේ ද යන්න පහත රටාව අධ්‍යයනය කරමින් විස්තර කරන්න.





පහත දැක්වෙන සංඛ්‍යා ඔත්තේ හා ඉරට්ටේ සංඛ්‍යා ලෙස වෙන් කර වගුව තුල ලියන්න.

17, 73, 116, 98, 126, 320, 657, 391, 573, 628, 873, 936

| **ඔත්තේ සංඛ්‍යා** | **ඉරට්ටේ සංඛ්‍යා** |
|---|---|
| | |

උපුල් හා නිමල් ඔවුන්ගේ නිවසේ පිහිටීම හා ඔවුන්ගේ පාසලේ පිහිටීම පහත රූපයේ දක්වා ඇත. උපුල් පාසලට යන්නේ ආරෝහණ ක්‍රමයට අනුපිලිවෙලින් ඉරට්ට සංඛ්‍යා යා කිරීමෙන් ලැබෙන පාර දිගේය. නිමල් පාසලට යන්නේ ආරෝහණ ක්‍රමයට අනුපිලිවෙලින් ඔත්තේ සංඛ්‍යා යා කිරීමෙන් ලැබෙන පාර දිගේය.

I. එලෙස සංඛ්‍යා යා කර ඔවුන් පාසලට යන මාර්ග දෙක ඇද දක්වන්න.
II. කෙටිම මාර්ගයෙන් පාසලට ගියේ කවුද?



පෙලපොතේ 27 පිටුව හොඳින් අධ්‍යයනය කරන්න.

පෙලපොතේ 28 පිටුවේ 14.1 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න. 29 පිටුවේ 14.2 අභ්‍යාසය ද නිවැරදිව සම්පූර්ණ කරන්න.

**<u>ප්‍රථමක සංඛ්‍යා හා සංයුත සංඛ්‍යා හඳුනා ගැනීම</u>**

පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| සංඛ්‍යාව | ලිවිය හැකි සාධක | සාධක ගණන |
|---|---|---|
| 1 | 1 | 1 |
| 2 | 1, 2 | 2 |
| 3 | | 2 |
| 4 | 1, 2, 4 | 3 |
| 5 | | |
| 6 | | |
| 7 | | |
| 8 | 1, 2, 4, 8 | 4 |
| 9 | | |
| 10 | | |
| 11 | 1, 11 | 2 |
| 12 | | |
| 13 | | |
| 14 | 1, 2, 7, 14 | 4 |
| 15 | | |

ඉහත සංඛ්‍යා අතරින් එකිනෙකට වෙනස් සාධක 2 ක් පමණක් ඇති සංඛ්‍යා මොනවාද?

ඉහත සංඛ්‍යා අතරින් එකිනෙකට වෙනස් සාධක 2 කට වැඩි ගණනක් ඇති පූර්ණ සංඛ්‍යා මොනවාද?

**එකිනෙකට වෙනස් සාධක 2 ක් පමණක් ඇති සංඛ්‍යා ප්‍රථමක සංඛ්‍යා නම් වේ.**

**එකිනෙකට වෙනස් සාධක 2 කට වැඩියෙන් ඇති පූර්ණ සංඛ්‍යා සංයුත සංඛ්‍යා නම් වේ.**

1, ප්‍රථමක සංඛ්‍යාවක් හෝ සංයුත සංඛ්‍යාවක් නොවීමට හේතු ලියන්න.

- පලමු ප්‍රථමක සංඛ්‍යා 15 ලියන්න.
- පලමු සංයුත සංඛ්‍යා 15 ලියන්න.
- ඉරට්ටේ ප්‍රථමක සංඛ්‍යාවක් ලියන්න.
- සංයුත සංඛ්‍යාවක් වන පලමු ඔත්තේ සංඛ්‍යා 5 ලියන්න.

පෙලපොතේ 32 පිටුව බලන්න. එහි ඇති 14.3 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න